ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
### I කොටස

කාලය පැය 2 යි.

නම: .................................................................................... අංකය:- ................. පන්තිය:- ...........

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) කිසියම් ආයතනයක ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායමක් ආයතනයේ ඉදිරි වැඩ කටයුතු පිළිබඳ සැලසුම් තීරණය කරන්නට වූහ. මෙවැනි අවස්ථාවක දැකිය හැක්කේ,

1) අන්තර් පුද්ගල සන්නිවේදනය යි.
2) සමූහ සන්නිවේදනය යි.
3) වාචික සන්නිවේදනය යි.
4) අවධිමත් සන්නිවේදනය යි.
5) අන්තර්වර්ති සන්නිවේදනය යි.

02) ශත වර්ෂ ගණනාවක් පැවති සංවෘත සමාජ හා රාජ්‍ය ව්‍යුහයන් දුර්වල වෙමින්, නව සමාජ සැකැස්මක් නිර්මාණය වී මානව සංහතියම ඒකක සමස්ත සමාජයක් බවට පත් වෙමින් පවතී. මින් කියවෙන්නේ,

1) සංවර්ධන සංකල්පය පිළිබඳව යි.
2) ස්ව සංකල්පය පිළිබඳව යි.
3) නවීකරණ සංකල්පය පිළිබඳව යි.
4) ගෝලීයකරණ සංකල්පය පිළිබඳව යි.
5) ස්වරාජ්‍ය සංකල්පය පිළිබඳව යි.

03) කිසියම් මාධ්‍යයක ලක්ෂණ කිපයක් පහත දැක්වේ.

a. සමාජ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාත්මක වේ.
b. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය අගය කරයි.
c. දැවෙන සමාජ, ආර්ථික, දේශපාලනික ප්‍රශ්න විෂය පථය වේ.

මෙම ලක්ෂණ දැකිය හැකි වන්නේ,

1) විකල්ප හා විරෝධාකල්ප මාධ්‍යයේ ය.
2) ගුවන් විදුලි මාධ්‍යයේ ය.
3) පෞද්ගලික රූපවාහිනී මාධ්‍යවල ය.
4) රජයේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍යවල ය.
5) පුරවැසි මාධ්‍යයේ ය.

04) ඵලදායී කථනයේ දී,

a. ඉරියව්, ඉඟි හා සංඥා භාවිතා කරයි.
b. ආවේගශීලි විය යුතුය.
c. ඉවසීම හා සංයමය කථනයට එක්විය යුතුය.
d. කථිකයා තම අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් කථා කළ යුතුය.

ඉහත ප්‍රකාශ අතරින්,

1) A හා B සත්‍ය වන අතර C හා D අසත්‍ය වේ.
2) A හා C සත්‍ය වන අතර B හා D අසත්‍ය වේ.
3) A හා D සත්‍ය වන අතර C හා D අසත්‍ය වේ.
4) B හා C සත්‍ය වන අතර A හා D අසත්‍ය වේ.

05) හිමාලි පාසලේ සැමගේ සිත දිනාගත් මිතුරියකි. ඇය ඕනෑම අයෙකුගේ ගැටලුවකට සාවධානව සවන් දෙයි. අන් අයව වටහා තේරුම් ගනිමින් දුක සැප බෙදා ගනියි. වහා උදව් උපකාර කරයි. ඇයව හඳුන්වා දීමට වඩාත් ගැළපෙන ප්‍රකාශය,

1) හිමාලි දුක්ගන්නාරාළ කෙනෙකි.
2) හිමාලි පුළුල් අත්දැකීම් රාශියක් ඇත්තියෙකි.
3) ඇය සහානුභූතියෙන් යුතු තැනැත්තියෙකි.
4) සන්නිවේදන නිපුණතාවන්ගෙන් යුක්ත අයෙකි.
5) පරාර්ථකාමී අදහස් ඇත්තියෙකි.

06) සන්නිවේදනයේ මූලික හා අත්‍යවශ්‍ය පාර්ශවයක් නොවන්නේ,

1) සන්නිවේදන තාක්ෂණය යි.
2) ග්‍රාහකයා ය.
3) සන්නිවේදකයා ය.
4) මාධ්‍ය ය.
5) සංදේශය යි.

07) සුනිමල් සාහිත්‍ය සමිතියේ සභාපති වේ. ඔහු ඕනෑම කටයුත්තක දී තමාට පැවරුණු වැඩ කොටස ගැන පමණක් නොව නොපැවරුණු වැඩ කොටස් පිළිබඳව ද සොයා බලා කටයුතු කරයි. ඒ අනුව සුනිමල්,

1) සමූහයේ පැවැත්මට අත්‍යවශ්‍ය වේ.
2) ක්‍රියාකාරී සාමාජිකයෙකි.
3) සමාජයේ පෙර ගමන් කරුවෙකි.
4) වගකීම හා වගවීම හඳුනා ගෙන ක්‍රියා කරන්නෙකි.
5) තම යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කරන්නෙකි.

08) ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත් වූ මත කිපයක් පහත දැක්වේ.

a. සෑම සමාජ පන්තියක්ම ආකර්ශනය කර ගනී.
b. කල් පවතින ස්වභාවයෙන් යුක්ත වේ.
c. ජනමාධ්‍ය මත ව්‍යාප්ත වේ.
d. නිෂ්පාදන අතිරික්තයක් වේ.
e. පහසුවෙන් පරිභෝජනය කළ හැකිය.

ඉහත ප්‍රකාශ අතරින්,

1) A හා D සමග එකඟ විය හැකි අතර B, C හා E සමග එකඟ විය නොහැක.
2) A හා B සමග එකඟ විය හැක. B, C, E සමග එකඟ විය නොහැක.
3) A, C හා D සමග එකඟ විය හැක. B, E සමග එකඟ විය නොහැක.
4) A, C හා E සමග එකඟ විය හැක. B, D සමග එකඟ විය හැක.
5) A, B, C, D, E යන සියල්ලම සමග එකඟ විය හැකිය.

09) මාධ්‍ය සංස්කෘතිය පිළිබඳව ළමුන් කිපදෙනෙකු අතර ඇති වූ කතා බහක දී ඉදිරිපත් වූ ප්‍රකාශ කිපයක් පහත දැක්වේ.

a. මාධ්‍ය සංස්කෘතියෙන් නවීකරණය වීමට සමාජය තුළ ඇති කැමැත්ත නිරූපණය වේ.
b. මාධ්‍ය සංස්කෘතිය සමාජය විසින්ම බිහි කර ගනියි.
c. මාධ්‍ය සංස්කෘතියෙන් සැබෑ සමාජ අවශ්‍යතා පෙන්වා දෙයි.
d. මාධ්‍ය සංස්කෘතිය සම්ප්‍රදායික සංස්කෘතිය අතික්‍රමණය කරයි.

ඉහත ප්‍රකාශ අතරින්,

1) A හා B සත්‍ය වන අතර C හා D අසත්‍ය වේ.
2) A හා C සත්‍ය වන අතර B හා D අසත්‍ය වේ.
3) A හා D සත්‍ය වන අතර C හා D අසත්‍ය වේ.
4) B හා C සත්‍ය වන අතර A හා D අසත්‍ය වේ.
5) B හා D සත්‍ය වන අතර A හා B අසත්‍ය වේ.

10) පන්ති කාමරයේ දී මිතුරින් දෙදෙනෙකු අතර ආරවුලක් හට ගන්නේ යැයි සිතමු. එහිදී මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීමේ වගකීම ඔබට හිමිවිනි. ඔබ විසින් නොකළ යුතු දෙයක් වන්නේ,

1) අපක්ෂපාති දෙපාර්ශවයටම උපකාර කිරීම.
2) එක් පාර්ශවයක් සමග තනිව සාකච්ජා කිරීම.
3) දෙපාර්ශවයටම මුණගැසී අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබාදීම.
4) දෙපාර්ශවයටම කෝපය පිටකර ගැනීමට අවස්ථාව ලබා දීම.
5) යෝජනා හා පණිවිඩ දෙපාර්ශවය වෙත ගෙන යාම.

11) ගැටුමකට අදාළ පුද්ගලයන් දිගින් දිගටම ගැටුම පවත්වා ගෙන යාම සඳහා පොළඹවමින් එයින් වාසි ලබන පිරිස හඳුන්වා දිය හැක්කේ,

1) ඍජු පාර්ශවකරුවන්
2) වක්‍ර පාර්ශවකරුවන්
3) මැදිහත්කරුවන්
4) පාර්ශවකරුවන්
5) තුන්වන පාර්ශවකරුවන්

12) පහත සාධක අතරින් ගෘහස්ථ සාමය හා සහජීවනයට ප්‍රබලවම බලපානු ලබන්නේ,

1) පවුලේ ආර්ථික මට්ටම යි.
2) පවුලේ අධ්‍යාපනික මට්ටම යි.
3) පවුලේ සංස්කෘතික පසුබිම යි.
4) සන්නිවේදන නිපුණතා භාවිතය යි.
5) ජනමාධ්‍යය භාවිතය යි.

13) වර්තමානයේ විවිධ පවුල්වල සාමාජිකයන් විනෝදය සඳහා අනුගමනය කරන කිපයක් මෙසේය.

a. ජනමාධ්‍යය සමග ඇලී ගැලී සිටීම.
b. සැලසුම් සහගත චාරිකාවක යෙදීම.
c. රාත්‍රි සමාජශාලා වෙත යෑම.
d. ගෘහය තුළ කුඩා සාජ්ජයක් දැමීම.

ඒ අතරින් ගෘහස්ථ සාමය හා සහජීවනය ගොඩනංවා ගැනීම සඳහා යෝග්‍ය වන්නේ,

1) A හා C ය.
2) A හා D ය.
3) B හා C ය.
4) B හා D ය.
5) A හා B ය.

14) කිසියම් ක්‍රියාවලියක ප්‍රතිඵල පහත දැක්වේ.

a. සදාචාරය බිඳ වැටීම.
b. මිනිස් අයිතිවාසිකම් පිරිහීම.
c. ආර්ථික විෂමතාවයන් ඇති වීම.

ඉහත තත්ත්වයක් ඇති විය හැක්කේ,

1) අන්තර් සබඳතා දුර්වලවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
2) ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි.
3) දේශපාලන ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි.
4) පවත්නා අධ්‍යාපන ක්‍රමයේ දුර්වලතාවයේ ප්‍රතිඵලයක් වශයෙනි.
5) සමාජයීය සාමය හා සහජීවනයේ බිඳ වැටීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

15) කිසියම් සංදේශයක් විචාරාත්මකව කියවා භාවිතයට ගැනීමේ හැකියාව අර්ථ ගැන්වෙන්නේ,

1) මාධ්‍ය විචාරය නමිනි.
2) මාධ්‍ය සාක්ෂරතාවය නමිනි.
3) මාධ්‍ය අධ්‍යාපනය නමිනි.
4) මාධ්‍ය අධ්‍යයනය නමිනි.
5) මාධ්‍ය සංස්කෘතිය නමිනි.

16) මාධ්‍ය සංදේශය මගින් සිදුවන අයහපත් බලපෑම අවම කිරීමට ගත හැකි ප්‍රායෝගික පියවර වන්නේ,

1) රාජ්‍ය මැදිහත් වීම ය.
2) මාධ්‍ය ආචාර ධර්ම පැනවීම ය.
3) සුදුසු මාධ්‍යකරුවන් තැනීම ය.
4) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම ය.
5) මාධ්‍ය විචාරය දියුණු කිරීම යි.

17) සංවර්ධන සන්නිවේදනයේ දී යොදා ගන්නා ක්‍රම විධි වල ලක්ෂණ කිපයක් පහත දැක්වේ.

1) විශ්වාසනීයත්වයෙන් යුක්තය.
2) සමාජයේ බනකේන්ද්‍ර වල පුද්ගලයන්ගේ සිතැඟියාවන් පල කිරීම.
3) අන්තර්ගතය, ආකෘතිය සරල ය.
4) ආගන්තුක භාවයෙන් යුක්ත ය.
5) ඉහල ලක්ෂණ අතුරින් සාම්ප්‍රදායික සංවර්ධන සන්නිවේදන ක්‍රමවල දැකිය හැකි ලක්ෂණ වන්නේ,

1) A හා B පමණි.
2) A හා C පමණි.
3) A හා D පමණි.
4) B හා C පමණි.
5) B හා D පමණි.

18) සංවර්ධන සන්නිවේදන භාවිතය සම්බන්ධයෙන් සදොස් ප්‍රකාශය තෝරන්න.
   1) තුන්වන ලෝකයේ රටවල සංවර්ධන සන්නිවේදන භාවිතය වැඩිපුර අත්හදා බලයි.
   2) සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විවිධ ආකෘති ඉදිරිපත්ව ඇත.
   3) බටහිර රටවල සංවර්ධන සන්නිවේදන භාවිතය තුන්වන ලෝකයේ රටවල ට ද ඉතා සාර්ථකය.
   4) සංවර්ධන සන්නිවේදනයේ දී පුද්ගල ආකල්ප සුවිශේෂ වේ.
   5) සංවර්ධන සන්නිවේදනයේ දී විශේෂඥ දැනුම හා ප්‍රජාවගේ අදහස් සංකලනය විය යුතුයි.

19) ස්වසංකල්පය සම්බන්ධයෙන් ළමුන් කිපදෙනෙකු දැක්වූ අදහස් පහත දැක්වේ.
   A- ස්වසංකල්පය උපතින් පිහිටන්න කි.
   B- සන්නිවේදන ක්‍රියාවලිය හේතු කොට ගෙන පෝෂණය වේ.
   C- ස්වසංකල්පය ගතික ස්වභාවයෙන් යුක්ත ය.
   ඉහත ප්‍රකාශ අතුරින්,
   1) A හා B නිවැරදි ය.
   2) A පමණක් නිවැරදි ය.
   3) B හා C නිවැරදි ය.
   4) A හා B නිවැරදි ය.
   5) C පමණක් නිවැරදි ය.

20) ජනමාධ්‍යය ක්‍රියාකාරිත්වය මත බිහිවන සංස්කෘතිය,
   1) ජන සංස්කෘතිය යි.
   2) ජාතික සංස්කෘතිකය යි.
   3) ගැමි සංස්කෘතිය යි.
   4) ජනප්‍රිය සංස්කෘතිය යි.
   5) වාර්ගික සංස්කෘතික යි.

21) ප්‍රථම වරට සන්නිවේදන බාධක හඳුන්වා දුන් සන්නිවේදන ආකෘතිය වන්නේ,
   1) ලැස්වෙල් ආකෘතිය යි.
   2) බර්ලෝගේ ආකෘතිය යි.
   3) ඔස්ගුඩ් හා ශ්‍රාම් ආකෘතිය යි.
   4) ෂැනන් හා විවර් ආකෘතිය යි.
   5) ඇරිස්ටෝටල් ආකෘතිය යි.

22) මෙවර පාසලේ අධ්‍යාපන චාරිකාවේ දී ළමයි විවිධ ස්ථාන යෝජනා කළහ. එම ගමනට සහභාගී වීමට මා අකමැති වුව ද, එවැනි යෝජනාවක් කිරීමට ඔවුන්ට අයිතිය ඇති බව මම පිළිගනිමි.
   1) විසම්මුතියේ වැදගත්කම යි.
   2) සහානුභූතියේ වැදගත්කම යි.
   3) සාධාරණත්වයේ අයිතිය යි.
   4) මිත්‍රත්වයේ ස්වභාවය යි.
   5) සාමූහිකත්වයේ අවශ්‍යතාවය යි.

23) මෙරට ජනමාධ්‍ය ඔස්සේ ජනප්‍රිය සංස්කෘතිගාංග සීමාව ඉක්මවා ග්‍රාහක ගතවීමේ ක්‍රියාවලිය නිසා ඇතිවන තත්ත්වය,
   1) ජනමාධ්‍ය වර්ගීකරණයට හේතුවක් වේ.
   2) තාරුණ්‍යයේ පිබිදීමට හේතු වේ.
   3) සංස්කෘතික බන්ධුත්වයට හේතු වේ.
   4) පවිත්‍ර සන්නිවේදන සංස්කෘතියකට හේතු වේ.
   5) සංවර්ධන සන්නිවේදනයේ දී බාධාවක් වේ.

24) පාසලේ දන්ත සෞඛ්‍ය සායනයක් පැවැත්වීමට කැමති කිසියම් වෙළඳ ආයතනයක් විසින් නොමිලයේ ඔවුන්ගේ වෙළඳ නාමය සහිත දත් බුරුසුවක් බැගින් සියලුම ළමුන්ට බෙදා දෙන ලදී. මෙය,
   1) අදාළ වෙළඳ නාමය ඇති දත් බුරුසුව වඩා යෝග්‍ය බව පෙන්වා දීම යි.
   2) එම දත් බුරුසුව වෛද්‍යවරු අනුමත කර ඇති බව තහවුරු කිරීමට යි.
   3) වෙනත් දත් බුරුසු භාවිතය දන්ත සෞඛ්‍යයට අහිතකර බව පෙන්වා දීමට ගත් උත්සාහය කි.
   4) අනෙකුත් වෙළඳ නාම අතර තම වෙළඳ නාමය තහවුරු කිරීමට ගත් උත්සාහය යි.
   5) පාසල් ළමුන්ගේ දන්ත සෞඛ්‍ය නඟා සිටුවීමට ගත් උත්සාහය කි.

25) වර්තමාන සමාජයේ බොහෝ දෙනා කාල වේලාව නොමැති බව කියමින් එදිනෙදා කටයුතු අතපසු කර ගනිති. මෙසේ වීමට ආසන්නතම හේතු ලෙස ඔබ දකින්නේ,
   1) පෞද්ගලික කටයුතු අධික වීම යි.
   2) රාජකාරි කටයුතු අධිකවීම යි.
   3) ජනමාධ්‍යයට අනුව දෛනික න්‍යාය පත්‍රය සකස් කර ගැනීම යි.
   4) අධ්‍යාපනයේ අවශ්‍යතාවය දැන්වීම යි.
   5) පුද්ගල ආර්ථික සංවර්ධනයට මුල්තැන දීම යි.

26) පහත දැක්වෙන්නේ, පුවත්පත්වල බහුලව දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයකි.

A- දේශපාලනය පිළිබඳ අදහස් පළකරයි.

B- ආර්ථික ස්වභාවය ගැන සාකච්ඡා කරයි.

C- පුද්ගලික මට්ටමේ අවවාද දෙයි.

D- ගමන් බිමන් පිළිබඳ අත්දැකීම් ඉදිරිපත් කරයි.

E- සංගීත, චිත්‍රපටි, පොතපත ආදිය ගැන ගැන විවේචන දක්වයි.

ඉහත ඒවා අතරින් තිරු ලිපි රචනාවකට අයත් වීමට වඩාත් ඉඩ ඇත්තේ,

1) A පමණි. 2) A හා D පමණි. 3) A, B, D හා E පමණි.
4) A, B, C පමණි. 5) A, B, C, D හා E සියල්ල ම

27) ග්‍රාහකයාට නව අවබෝධයක් හා දැනුමක් ලබා දෙමින් නියෝග දීම, අනුශාසනා කිරීම, උපදෙස් දීම වැනි කාර්යයන් ඉටුකර ගත යුතු සංදේශ,

1) නඩත්තු සංදේශ වේ. 2) මෙහෙයුම් සංදේශ වේ. 3) විකල්ප සංදේශ වේ.
4) ප්‍රජා සහායක සංදේශ වේ. 5) ශක්තිජනක සංදේශ වේ.

28) සමාජයක මූලික ස්වභාවය පිළිබඳ ව නිවැරදි ව දක්වා ඇත්තේ,

1) වාණිජ අවශ්‍යතා මත ගොඩනැඟුණු සංවිධාන සමාජයක ව්‍යවසාය මූල අංශයට අයත් වේ.
2) කාර්මික අංශය හා නව නිපයුම් අංශය සමාජයේ මූලික ස්වභාවය ආකාර දෙකකි.
3) බැංකු, රක්ෂණ ආයතන, වෙළඳ සංගම් ආදිය ප්‍රජා මූල අංශයට අයත් වේ.
4) සමාජයක මූලික ස්වභාවය වෙනස් කිරීම දේශපාලනික අංශයට පමණක් අයත් කාර්යයකි.
5) ප්‍රජා මූල හා ව්‍යවසාය මූල වශයෙන් සමාජයක් ආර්ථික අංශය වර්ග කළ හැකිය.

29) එක්තරා අමාත්‍යාංශයක මුදල් වංචාවක් පිළිබඳ ව දැනගත් පුද්ගලයෙක් එය තමන් අයත් වන දේශපාලන පක්ෂයේ මිතුරන්ට පමණක් දැනුම්වත් කළේය. මෙය අයත් වන්නේ,

1) ඕපාදූප දාමයට ය. 2) තනි දාමයට ය. 3) අවධිමත් දාමයට ය.
4) පර්ෂද දාමයට ය. 5) සම්භාවිතා දාමයට ය.

30) පහත ඒවා අතරින් ජනප්‍රිය සංස්කෘතියට අයත් වන්නේ,

A- ව්‍යාපාරික අවශ්‍යතා මත බිහි වේ.

B- ළමා හා තරුණ පිරිස් ආකර්ශණය කර ගනියි.

C- කලාන්තරයක් වෙනස් නොවී පවතී.

D- ජනමාධ්‍ය සමග සමීප සම්බන්ධතාවක් පවත්වයි.

E- සමාජ චර්යාවලට බලපෑම් එල්ල කරයි.

1) A; B, C පමණි. 2) AB හා CD පමණි. 3) A, B, D හා E පමණි.
4) A, D, E පමණි. 5) A, B, C, D හා E සියල්ල ම

31) ශබ්ද, හඬ, සංගීතය ආදිය මගින් පුද්ගලයා තුළ චිත්ත රූප මැවෙන ආකාරයෙන් යමක් ඉදිරිපත් කිරීම වූ කලි,

1) ගුවන් විදුලි භාෂාණය යි. 2) ගුවන් විදුලි රූපණය යි. 3) රූපවාහිනි කථනය යි.
4) සිනමා රූපණය යි. 5) විද්‍යුත් ලේඛනය යි.

32) තමා පිළිබඳ ව පුවත්පතක පළවූ තොරතුරක් නිසා සිය කීර්තිනාමය බිඳ හෙළන බව එක්තරා දේශපාලනඥයෙක් පවසයි. එසේ නම් ඔහු කළ යුත්තේ,

1) වහාම අදාළ වාර්තාකරුවාට දඬුවම් කිරීම යි.
2) පොලිසියට පැමිණිලි කිරීම යි.
3) පුවත්පත් මණ්ඩලයට පැමිණිලි කොට නඩු මඟට පිවිසීම යි.
4) ඉහළ අධිකරණයේ අපහාස නඩුවක් ගොනු කිරීම යි.
5) දින 7 කට පෙර පුවත්පත් මණ්ඩලයට දැනුම් දීමයි.

33) පහත ප්‍රකාශවලින් මාධ්‍ය සංස්කෘතියට අයත් නොවීමට වඩාත් ඉඩ ඇති ප්‍රකාශය තෝරන්න. මාධ්‍ය සංස්කෘතිය,

1) කෘත්‍රිම ලෙස සමාජය වෙනස් කරයි.
2) බටහිර සංස්කෘතිකාංග විසරණය කරයි.
3) ආචාරශීලී සන්නිවේදනයකට හුරු කරයි.
4) සමාජ චර්යාවන් වෙනස් කරයි.
5) අන්තර්ජාතික සම්බන්ධතා ගොඩ නඟයි.

34) භූතානය ඔවුන්ට ම ආවේණික සංස්කෘතියක ලක්ෂණ රාශියක් කාලයක් තිස්සේ වෙනස් නොකරමින් පවත්වා ගෙන එනු ලබයි. එම සංස්කෘතික ලක්‍ෂණ අයත් වන්නේ,

1) සංස්කෘතික රාශිකෘතියට යි.
2) සංස්කෘතික කම්පණයට යි.
3) සංස්කෘතික සම්පර්කයට යි.
4) සංස්කෘතික ලැග්මට යි.
5) විරෝධී සංස්කෘතියට යි.

35) සංවර්ධන සංදේශ සඳහා ජනශ්‍රැතිය භාවිතය තුළින්,

1) ගැමි ජනයාගේ සහභාගිත්වය වර්ධනය කරගත හැකිය.
2) ග්‍රාහක කේන්ද්‍රීය සංදේශයක් සැලසුම් කළ හැකිය.
3) නිර්මාණකරණය සඳහා වැයවන වියදම අවම කරගත හැකිය.
4) පාර්ශවකරුවන් වෙත අවශ්‍ය දත්ත පමණක් ඉදිරිපත් කළ හැකිය.

ඉහත කරුණු අතුරින් සාවද්‍ය වන්නේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි. 4) Dපමණි. 5) E පමණි.

36) සංදේශ ග්‍රාහකගත කිරීමේ දී තම සංදේශය ඉලක්ක කණ්ඩායම වෙත පමණක් නිශ්චිතව ඉදිරිපත් කිරීම අපහසු වන්නේ,

1) ජන සන්නිවේදනයේ දී ය.
2) රූපවාහිනී සන්නිවේදනයේ දී ය.
3) සමාජජාල සන්නිවේදනයේ දී ය.
4) විද්‍යුත් සන්නිවේදනයේ දී ය.
5) අන්තර්ජාල සන්නිවේදනයේ දී ය.

37) ගැටුමක් කළමනාකරණ කිරීමේ අරමුණ මොනවාදැයි දේශකයා ඇසූ ප්‍රශ්නයට සිසුන් පිළිතුරු දුන්නේ මෙසේ ය.

අබිල - "ගැටුමක ප්‍රචණ්ඩකාරීත්වය මට්ටම අවම කිරීම."
අනුරාධා - "ගැටුමට සම්බන්ධ දෙපාර්ශවයේ ම අනුකූලතාවය ලබා ගැනීම."
අසේල - "නෑ, නෑ, ගැටුමක විනාශකාරී මට්ටම අවම කිරීම."
අමාමි - "ගැටුමේ තිව්‍රතාව හා ව්‍යාප්තිය වැළැක්වීමයි. ගැටුම් කළමනාකරණයට කියන්නේ"
අමන්දා - "ගැටුමට සම්බන්ධ දෙපාර්ශවයට ම පිළිගත හැකි විසඳුමකට එළඹීම."

මේ අය අතරින් වඩාත් ම නිවැරදි පිළිතුර ලබා දී ඇත්තේ,

1) අබිල, අනුරාධා හා අමන්දා
2) අබිල හා අසේල
3) අබිල, අමාමි හා අසේල
4) අනුරාධා හා අමන්දා
5) සියලු දෙනාම

38) ස්ව සංකල්පය යනු පුද්ගලයා ඔහුගේ ලක්‍ෂණ පිළිබඳවත්, ඔහු වෙනත් අය හා ඔහුගේ ම ජිවිතයේ විවිධ අංශ සමග දක්වන සම්බන්ධතා පිළිබඳවත් ගොඩ නගා ගෙන ඇති, කිසියම් වටිනාකම්වලින් යුක්ත වූ, සංජානනයන්ගෙන් සකස් වූ, සංවිධානාත්මක සංගත සංකල්පනික සමස්තයකි. ස්වසංකල්පය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

1) කාර්ල් රොජරස් විසිනි.
2) පෝල් ලැසාර්ස්ෆෙල් විසිනි.
3) බර්න් විසිනි.
4) පර්කි විසිනි.
5) මාග්‍රට් මීඩ් විසිනි.

39) ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සංදේශ සකස් කිරීමේ දී ජනශ්‍රැතියට ප්‍රමුඛතාව දිය යුතුයැයි සන්නිවේදන විශේෂඥයින් පෙන්වා දී ඇත. එවැනි නිගමනයකට එළඹීමට හැකි වන්නේ,

1) ජනශ්‍රැතියේ කෘති අයිතිය පිළිබඳ ගැටලුවක් නොපවතින බැවිනි.
2) ජනශ්‍රැතිය ජන විඥානයට සමීප බැවිනි.
3) ජනශ්‍රැතිය යනු ග්‍රාමීය මූලයක් සහිත නිර්මාණයක් වන බැවිනි.
4) ජනශ්‍රැතිය හා සංවර්ධනය අතර සම්බන්ධතාවයක් ඇති බැවිනි.
5) ජනශ්‍රැතිය නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමෝපායක් බැවිනි.

40) මාධ්‍ය ක්ෂේත්‍රයේ එක්තරා වෘත්තියෙකු සතු වන ලක්ෂණ කිහිපයක් මෙසේ දක්වා ඇත.

- සාමාන්‍ය ග්‍රාහකයන්ට වඩා වෙනස් ආකාරයකින් මාධ්‍ය විමර්ශනය කිරීමේ දක්ෂතාවයකින් යුක්තය.
- අසාමාන්‍ය ලෙස ලෝකය විනිවිද දැකීමේ චින්තකයකින් යුක්තය.
- විවිධ මාධ්‍ය විචාර න්‍යායයන් හා දෘෂ්ඨීන් පිළිබඳ මනා අවබෝධයක් හා නිපුණතාවයක් තිබේ.
- මාධ්‍යවේදීන්ට - මාධ්‍යයට මාධ්‍ය නිර්මාණයන්ට පහර දෙන්නෙකු නොව, සද් චේතනාවෙන් යුක්තව මග පෙන්වන්නකු ලෙස කටයුතු කරයි.

ඉහත අදහස් වඩාත් ගැළපෙන්නේ,

1) මාධ්‍ය නිර්මාණකරුවාට 2) පුවත් වාර්තාකරුවාට 3) මාධ්‍ය හිමිකරුවාට
4) මාධ්‍ය විචාරකයාට 5) මාධ්‍ය ග්‍රාහකයාට

41) අසල්වැසියෙකු සමග සුළු ගැටුමක් ඇති කරගත් පුද්ගලයෙකු, එම ආරවුල විසඳා ගැනීමට සිවිල් අධිකරණයක නඩු පවරනු වෙනුවට සමථ මණ්ඩලය වෙත යොමු කළේය. එයින් එම පුද්ගලයාට ඇති වාසියක් නොවීමට ඉඩ ඇත්තේ,

1) කාලය ඉතිරි වීම.
2) මුදල් ඉතිරි කර ගැනීමට හැකි වීම.
3) තමන් වෙනුවෙන් නියෝජිතයන් නොමැතිව තමන්ට ම කරුණු ඉදිරිපත් කළ හැකි වීම.
4) ආරවුලේ මෙන් ම දෙපාර්ශවයේ ම රහස්‍යභාවය ආරක්ෂා වීම.
5) අසල්වාසීන් සමග සම්පූර්ණයෙන් ම සබඳතා බිඳ දැමිය හැකි වීම.

42) විකල්ප ජනමාධ්‍ය පිළිබඳව මිතුරන් කිහිපදෙනකු අතර ඇති වූ සංවාදයක දී මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

නිමල් - ලාභයක් ලබන්න පුළුවන් වුනත් ඒක ප්‍රධාන අරමුණක් නෙමෙයි.
කමල් - ඒ වුනාට, ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවලට අභියෝගයක් එල්ල කරනවා.
අමල් - ඒත්, ඒ අය ඉලක්ක කරගන්නේ කුඩා ග්‍රාහක කණ්ඩායමක් නේ,
විමල් - කොහොම වුනත් ඒවායේ තියෙන්නේ අපක්ෂපාති ජනමාධ්‍ය භාවිතයක්

ඉහත ප්‍රකාශ අතුරෙන් ශ්‍රී ලංකාවේ විකල්ප ජනමාධ්‍යවලට අදාළ ප්‍රකාශ කරන්නේ,

1) නිමල් හා කමල් ය.
2) නිමල් හා අමල් ය.
3) නිමල්, අමල් හා කමල් ය.
4) කමල්, අමල් හා විමල් ය.
5) නිමල්, කමල්, අමල් හා විමල් සියල්ලම ය.

43) මාධ්‍ය සාක්ෂරතාවයේ දී විමසා බලන කරුණ / කරුණු වන්නේ,

1) සංදේශවල යටි අරුත 2) සංදේශයේ සංයුතිය 3) සංදේශයේ පසුබිම
4) මාධ්‍ය හිමිකාරීත්ව බලපෑම 5) ඉහත සියල්ලම

44) එක්තරා දේශකයෙක් ජන ගී මාධ්‍යය පිළිබඳව ඉදිරිපත් කළ පහත කරුණු අතරින් අවම වැදගත්කමක් සහිත වරණය වන්නේ,

1) ජනයාගේ සෞන්දර්ය්‍ය චින්තනය ජන ගීයෙන් මනාවට නිරූපණය වේ.
2) ජන ගී වලට ගායනා රටාවන් ද, ඒ ඒ කාර්යයන් හා අවස්ථාවන් සමග අනුබද්ධව පවතී.
3) ලෝකයේ ජන ගී වල ස්වර රටා සීමාරහිත පරාසයක පවතියි.
4) ජන ගී ගායනා නාද රටා පසු කාලයේ විවිධ මාධ්‍ය කලා නිර්මාණ සමග මුසු වී ඇත.
5) ජන ගායනා රිද්මය ඒ ඒ සමාජය ජනයාගේ හද ගැස්මේ රිද්මය බවට පත්ව ඇත.

45) ගෘහස්ථ සංස්කෘතිය වෙනස් කිරීම කෙරෙහි විද්‍යුත් මාධ්‍ය බලපා ඇති බව කියැවෙන ප්‍රකාශයක් නොවන්නේ,

1) ගෘහස්ථ සංස්කෘතිය මාධ්‍ය විසින් හසුරුවනු ලබයි.
2) ගෘහයේ මානව සම්බන්ධතා බිඳ හෙළීමට මාධ්‍ය හේතු වී ඇත.
3) පුද්ගලයින්ගේ සැබෑ ජීවිත ප්‍රශ්න ගැටලුවලට මාධ්‍ය තුළින් විසඳුම් සොයා ගැනීමට උත්සාහ කරයි.
4) මිනිසාගේ ස්වාධීන චින්තනය බිඳ දමා හරසුන් අපේක්ෂා නැගීමට මාධ්‍ය කටයුතු කරමින් සිටියි.
5) දැඩි තරඟකාරීත්වය හමුවේ සිය අනන්‍යතාවය පවත්වා ගැනීමට මාධ්‍යවලට හැකි වී නැත.

46) ග්‍රාහක ක්ෂේත්‍රය වෙත ප්‍රවේශ වීමේ බලාපොරොත්තුවෙන් ජනමාධ්‍යයේ කාලය හෝ අවකාශය මිලදී ගන්නේ,

1) මාධ්‍ය හිමිකරුවන් ය.
2) මහජන සම්බන්ධතා ක්‍රියාකාරීන් ය.
3) ප්‍රතිරූප ගොඩනගන්නන් ය.
4) අනුග්‍රාහක භවතුන් ය.
5) වෙළඳ දැන්වීම්කරුවන් ය.

47) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වඩාත් හොඳින් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1) ග්‍රාහකයා ආකර්ශණය කර ගනියි.
2) ව්‍යාපාරික ප්‍රජාව විසින් ඇති කරයි.
3) සත්‍ය වටහා දීමයි.
4) මාධ්‍ය අලෙවිය හීන කරයි.
5) සෑම ග්‍රාහකයෙක් ම ප්‍රතික්ෂේප කරයි.

48) මානවයා සතු සංඥා භාවිත කිරීමේ හැකියාව,

1) සමාජ උරුමය කි.
2) ප්‍රවේණික සාධකය කි.
3) ස්වභාවික උරුමය කි.
4) ජීව විද්‍යාත්මක උරුමය කි.
5) අධි ස්වභාවික උරුමය කි.

49) නිරූපණය සම්බන්ධ පහත ප්‍රකාශවලින් සාවද්‍ය ප්‍රකාශයක් විය හැක්කේ,

1) රූපණය පුද්ගල බද්ධ සංසිද්ධිය කි.
2) රූපණය ඉබේ හුරු වන්නකි.
3) රූපණය නිසා භාෂාවේ අර්ථය තහවුරු වේ.
4) රූපණය සංස්කෘතික විරෝධාකල්පය කි.
5) රූපණය ඉරියව් හා හැසිරීම්වලින් බිහි වේ.

50) ඉසුරිගේ නිවසේ ඇති සැටලයිට් තාක්‍ෂණයෙන් යුත් රූපවාහිනී යන්ත්‍රය ක්‍රියා කරවීමේ දී රූප රාමුව අපැහැදිලි සහ අදාළ නාලිකා විසන්ධි වීම නිතර දක්නට ලැබේ. එයින් සන්නිවේදනාත්මකව හඳුනා ගත හැක්කේ කුමක් ද?

1) රූපවාහිනී යන්ත්‍රය අලුත්වැඩියා කළ යුතුව ඇති බවයි.
2) රූපවාහිනී යන්ත්‍රය නිවැරදිව සුසර කළ යුතුව ඇති බවයි.
3) මාධ්‍ය බාධක සහිත බවයි.
4) අර්ථ බාධක සහිත බවයි.
5) ඇන්ටෙනාව වෙනස් කළ යුතු බවයි.

ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

## දෙවන වාර පරීක්ෂණය - 2016

### 13 ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

### II කොටස

**කාලය පැය 2 යි.**

නම: .................................................................................... අංකය:- ................. පන්තිය:- ...........

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01) සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියකි,

i) ඉහත අදහස ඉදිරිපත් කෙරෙන සන්නිවේදන ආකෘතිය ඇඳ නම් කරන්න. (ල.2)

ii) ආකේතකරණය හා විකේතකරණය යන ක්‍රියාවන් දෙක නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල.4)

iii) ජන සන්නිවේදන ක්‍රියාවලිය තුළ දොරටුපාල කාර්යය හා සම්බන්ධ පුද්ගලයන් තිදෙනෙකු නම් කර ඔවුන්ගෙ භූමිකාව විස්තර කරන්න. (ල.6)

iv) විකල්ප මාධ්‍යවල ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ල.8)

02) i) පුද්ගලාන්තර සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.2)

ii) නිර්වාචික සන්නිවේදනයේ ප්‍රබලතා දෙකක් නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න. (ල.4)

iii) මාධ්‍ය නිවේදනයක් සකස් කිරීමේ දී අවධානයට ගත යුතු මූලික කරුණු තුනක් විස්තර කරන්න. (ල.6)

iv) ඵලදායි කථනයක යෙදීමේ දී අනුගමනය කළ යුතු කරුණු හතරක් විස්තර කරන්න. (ල.8)

03) i) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක අඩංගු විය යුතු අංග හතරක් නම් කරන්න. (ල.2)

ii) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක් අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීම සඳහා යොදා ගත හැකි උපක්‍රම නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.4)

iii) සංවර්ධන සන්නිවේදනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගැනීමෙන් ඇති වාසි තුනක් විස්තර කරන්න. (ල.6)

iv) සංවර්ධන සන්නිවේදනයට වැඩසටහනක් සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට අනුගමනය කළ හැකි විධික්‍රම හතරක් විස්තර කරන්න. (ල.8)

04) i) ගැටුම් කළමනාකරණයට මගින් බලාපොරොත්තු වන අරමුණ දෙකක් සඳහන් කරන්න. (ල.2)

ii) ගැටුම් කළමනාකරණයට යොදා ගත හැකි ජය ජය මාදිලිය නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.4)

iii) ආයතනයක් තුළ ඇති වූ පුද්ගල ගැටුමක් නිරාකරණයට කිරීමට ඔබට පැවරී ඇතැයි සිතන්න. එහිදී ඔබට අනුගමනය කළ හැකි උපක්‍රම තුනක් විස්ත කරන්න. (ල.6)

iv) ශ්‍රී ලංකාවේ සමථකරණ ක්‍රියාවලිය පිළිබඳ විස්තර කරන්න. (ල.8)

05) i) සරල මානසික පීඩා හතරක් නම් කරන්න. (ල.2)

ii) සරල මානසික පීඩා ඇති වූ විට ඒවාට මුහුණ දීම සඳහා අනුගමනය කළ හැකි උපක්‍රම දෙකක් විස්තර කරන්න. (ල.4)

iii) ගෘහයක සාමය සහජීවනය බිඳ වැටීමේ අහිති ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ල.6)

iv) ගෘහයක සාමාජිකයින් විනෝදය හා විශ්‍රාන්තියට යොමු වීමෙන් එය මානසික හා ගෘහස්ථ භාවය බලපාන අයුරු කරුණු හතරක් යටතේ විස්තර කරන්න. (ල.8)

06) i) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය යනු කුමක් ද? (ල.2)

ii) ප්‍රචණ්ඩත්වය රූපවාහිනී තුළ නිරූපණය වන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.4)

iii) මාධ්‍ය සාක්ෂරතාවට අදාළ කුසලතා තුනක් විස්තර කරන්න. (ල.6)

iv) ජනප්‍රිය සංස්කෘතියේ මූලික ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ල.8)

07) i) පුරවැසි මාධ්‍ය වේදයේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.2)

ii) ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාව ශක්තිමත් කිරීමට යොදාගත හැකි උපක්‍රම දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.4)

iii) මාධ්‍ය සංස්කෘතිය සමාජය මත ඇති කරන අයහපත් බලපෑම් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.6)

iv) ගෝලීයකරණය ශ්‍රී ලංකාවේ සන්නිවේදන ක්ෂේත්‍රය තුළ සිදුකර ඇති බලපෑම් හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.8)

********